Annex

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01,
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | (94)-011-2484500<br>(94)-011-2484600<br>(94)-011-2484700 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | (94)-011-2449823 | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DMS/Cir/2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2020.10. 26 |

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 02/2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>රාජ්‍ය අංශයේ ආයතන සඳහා අනුමත තනතුරුවලට බඳවාගැනීම / පුරප්පාඩු පිරවීම</u>

රජයේ සංවර්ධන ක්‍රියාදාමය වේගවත් කිරීමේදී කාර්යක්ෂම ලෙස මානව සම්පත යොදාගැනීම අරමුණු කරගෙන රාජ්‍ය අංශයේ පවතින තනතුරු සඳහා බඳවාගැනීමේදී / පුරප්පාඩු පිරවීමේදී දැනට පවතින චක්‍රලේඛ සීමාවන් සංශෝධනය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, රාජ්‍ය අංශයේ අනුමත තනතුරුවලට බඳවාගැනීමේ / පුරප්පාඩු පිරවීමේ වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම්ට පවරනු ලැබේ. එහිදී පහත සඳහන් කරුණුවලට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කෙරේ.

02. අනුමත තනතුරකට බඳවාගැනීමේදී / පුරප්පාඩු පිරවීමේදී කටයුතු කළ යුතු ආකාරය

(i) යම් ආයතනයක තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ද ඊට අදාළව සේවා ව්‍යවස්ථාවන් / බඳවාගැනීමේ පරිපාටීන් අදාළ පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව / කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව / පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති විටක, එම අනුමත තනතුරු සංඛ්‍යාවේ පුරප්පාඩු පවතී නම් එම පුරප්පාඩු පිරවීම සඳහා නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ.

(ii) සියලුම බඳවාගැනීම් / පුරප්පාඩු පිරවීම් අනුමත සේවා ව්‍යවස්ථාවට / බඳවාගැනීමේ පරිපාටියට අනුකූලවම සිදු කළ යුතු ය.

(iii) භාණ්ඩාගාරයේ අරමුදල් යොදාගනිමින් සිදු කරනු ලබන බඳවාගැනීම් / පුරප්පාඩු පිරවීම් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන එම කටයුතු ආරම්භ කිරීමට පෙර වෙන්කරවා ගත යුතුය.

(iv) ස්වයං මූල්‍යනය මත ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල බඳවාගැනීමේදී / පුරප්පාඩු පිරවීමේදී අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අදාළ ආයතනයන්හි වාර්ෂික අයවැය ලේඛන මගින් වෙන් කර ගෙන තිබිය යුතු ය.

(v) බඳවාගැනීම් / පුරප්පාඩු පිරවීම් කළ යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුරට ලබා දී ඇති වැටුප් / වැටුප් කේත යටතේ පමණක් වන අතර එක් එක් ආයතන විසින් කාර්යමණ්ඩල වැටුප් හා දීමනා තීරණය කිරීම සිදු නොකළ යුතු ය.

(vi) අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම යාමේදී අදාළ පුරප්පාඩුව පිරවීම සඳහා විධිමත් පරිදි අනුප්‍රාප්තික සැලැස්මක් සෑම ආයතනයක් විසින්ම සකස් කරගත යුතු ය. එම සැලැස්මට අනුව කටයුතු කළ නොහැකි අවස්ථාවලදී පමණක් අදාළ සේවකයන් විශ්‍රාම යාමට මාස තුන (03) කට පෙර ආයතනයේ අවශ්‍යතාවය අනුව බඳවාගැනීම් සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කළ යුතු ය.

(vii) ආයතනයන් හි කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට අදාළ ආයතනය විසින් නවීන තාක්ෂණය භාවිතයෙන් වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමට අවශ්‍ය අවම තනතුරු සංඛ්‍යාවක් හඳුනාගෙන විධිමත් සාධාරණීකරණයක් ද සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු ය.

(viii) ප්‍රාථමික සේවා ශ්‍රේණියේ (PL) තනතුරු සඳහා අවශ්‍ය සේවක පිරිස් බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව මගින් ලබාදීමට තීරණය කර ඇත.

ඒ අනුව, ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් "සියලු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම" යන මැයෙන් නිකුත් කරන ලද 2020.02.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානවලට අනුකූලව තවදුරටත් කටයුතු කළ යුතු ය.

(ix) ඉහත viii හි සඳහන් ප්‍රාථමික සේවා ගණය යටතේ අනුමත තනතුරුවල පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී, අනුමත සේවා ව්‍යවස්ථා හෝ බඳවාගැනීමේ පරිපාටි ප්‍රකාරව අභ්‍යන්තර උසස්වීම් මගින් අදාළ පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථාව සළසා දී ඇත්නම් ඒ අනුව කටයුතු කළ යුතු අතර අනෙකුත් සියලුම අවස්ථාවන්හි දී, බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව වෙතින් අදාළ සේවා සපුරා ගැනීමට කටයුතු කළ යුතු ය.

(x) මහජනයාට කඩිනම් හා සමීප සේවාවක් ලබාදීම අරමුණු කරගනිමින් හැකිතාක් දුරට ප්‍රාදේශීය මට්ටමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක ස්ථානවලට සේවා සැපයීම සහ අධීක්ෂණය කිරීම පහසු වන පරිදි නිලධාරීන් ප්‍රධාන කාර්යාලවලින් බිම් මට්ටමට යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

03. සෑම බඳවාගැනීමක්ම / පුරප්පාඩු පිරවීමක්ම සිදු කිරීමෙන් පසු ඊට අදාළ විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ද, පළාත් සභා සම්බන්ධයෙන් වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ මුදල් කොමිෂන් සභාව වෙත ද කඩිනමින් ඉදිරිපත් කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව සිදු කරන බඳවාගැනීම් / පුරප්පාඩු පිරවීම් සහ වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අදාළ පත්කිරීම් බලධාරියා / ආයතන ප්‍රධානියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බව අවධාරණය කරනු ලැබේ.

05. "රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්යමණ්ඩල බඳවාගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙනි" යන මැයෙන් නිකුත් කරන ලද 2018.07.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 සහ භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/Policy/Recruitments හා 2019.11.20 දිනැති ලිපිය මෙයින් අවලංගු කරනු ලැබේ.

06. මෙම චක්‍රලේඛය පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484640 මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතිය හැකි ය.

එස්. ආර්. ආටිගල

භාණ්ඩාගාරයේ ලේකම් සහ

මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. විගණකාධිපති
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
8. ලේකම්, මුදල් කොමිෂන් සභාව